විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2016

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2016
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2016.01. 12

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ත්‍රිවිධ හමුදාධිපති වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයවීම්

විශ්‍රාම යන රජයේ නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු අවකරණ (උදා- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ණය ශේෂය, අලාභ, වැඩිපුර වැටුප් ගෙවීම්) අදාළ විශ්‍රාමිකයාගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකරනු ලබයි. මෙම අයකිරීම් සිදුකර, පළාත් සභා ආයතන වෙත අදාළ අවකරණ චෙක්පත එවීමත්, මධ්‍යම රජයේ ආයතන සඳහා අවකරණ මුදලට අදාළ ප්‍රතිපාදන නිදහස් කිරීමත් මඟින් අදාළ අයකිරීම් සිදු කරනු ලැබේ. මෙම ක්‍රමවේදය 2016 ජනවාරි මස සිට පහත පරිදි ක්‍රියාත්මක වන බැවින් ඒ පිළිබඳව ඔබ යටතේ ඇති ආයතන සහ අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

### 02. මධ්‍යම රජයේ ආයතන සම්බන්ධයෙන්

විශ්‍රාමික නිලධාරියාගෙන් රජයට අයවිය යුතු අයවීම් සම්බන්ධයෙන් අදාළ ප්‍රතිපාදන නිදහස් කිරීමේ ලිපියක් මින් ඉදිරියට නිකුත් නොකෙරේ. ඒ සඳහා අදාළ ප්‍රතිපාදන වෙන් කිරීමේ අනුමැතිය, විශ්‍රාමිකයාගේ විශ්‍රාම ලියාපදිංචි අංකය දැන්වීම සඳහා නිකුත් කරන ලිපිය (විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පල කරන) මඟින්ම ප්‍රතිපාදන නිදහස් කෙරේ. එමඟින් වෙන් කරන ප්‍රතිපාදන මඟින් අදාළ අවකරණ ඔබගේ මාසික ගිණුම් සාරාංශ මඟින් ගිණුම්ගත කර පියවා ගැනීමට කටයුතු කළ යුතුය.

### 03. පළාත් සභා ආයතන සම්බන්ධයෙන්

පළාත් සභා ආයතන සම්බන්ධ අවකරණ වලට අදාළව චෙක්පත් නිකුත් කිරීමක් සිදු නොකෙරේ. ඒ අනුව අදාළ අවකරණ ඍජුවම අදාළ ආයතනයේ නිල බැංකු ගිණුමට බැර කිරීම සිදු කෙරේ. ඒ අනුව අදාළ ආයතනයේ මාසික බැංකු ප්‍රකාශය පරීක්ෂා කර මුදල් බැර වීම තහවුරු කරගෙන අවකරණ පියවා ගැනීමට කටයුතු කළ යුතුය. අවකරණ බැර වීම පිළිබඳ තොරතුරු විශ්‍රාමිකයාගේ ලියාපදිංචි අංකය දැන්වීම සඳහා නිකුත් කරන ලිපියේ ( විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පල කරන) සඳහන් කරනු ලබයි.

04. විශ්‍රාමික ලියාපදිංචි අංකය දැන්වීමේ ලිපිය පහත පරිදි ලබා ගත හැක

www.pensions.gov.lk ⟶ Payment Information ⟶

| | |
|---|---|
| Nic No | |
| Pension No | |

⟶ Submit

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
4. ලේකම් - මුදල් අමාත්‍යාංශය
5. විගණකාධිපති - අ.කා.ස.